# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

## මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

## தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

105 - 5th Lane, Colombo - 03, Sri Lanka
Tel: +94 11 2564404, Fax: +94 11 4722632
E-mail: cmev@cpalanka.org Website: http://cmev.wordpress.com

**19.00 පැය 2009 ඔක්තෝබර් 10 වන දින පැවැති දකුණු පළාත් සභා මැතිවරණයේ දී සිදු වූ බරපතල සිදුවීම් පිළිබඳ වූ අවසාන වාර්තාව.**

දකුණු පළාත් සභා ඡන්ද විමසීමේ කටයුතු අවසන් වන අවස්ථාව වන විට CMEV ආයතනයට ලද තොරතුරු අනුව සමස්ථ ඡන්ද භාවිතයේ ප්‍රතිශතය දළ වශයෙන් 63.66% ක් (වෙනස් වීමට ඉඩ ඇත) ලෙස වාර්තා වේ. ඒවා දිස්ත්‍රික්ක මට්ටමින් ගත්කළ හම්බන්තොට 66% මාතර 68% ගාල්ල 57% ක් ලෙස වාර්තා වේ. මෙය 2004 දකුණු පළාත් සභා මැතිවරණයේ ඡන්ද ප්‍රතිශතයන් වන 55.99% වූ හම්බන්තොට, 54.43% වූ මාතරද, 56.5% ගාල්ල ද, සමස්ථ පළාතේ ප්‍රතිශතය 55.64% වන සමඟ ද සංසන්දනය කළ යුතු වේ.

ඡන්ද කටයුතු පැවැත් වූ අද දින CMEV ආයතනයට සමස්ථ සිදුවීම් 29 ක් වාර්තා වූ අතර ඉන් 8ක් බරපතල සිදුවීම් ලෙස ද 21 ක් බරපතල නොවන සිදුවීම් ලෙස සඳහන් වේ.

අවස්ථා කිහිපයක දී CMEV ආයතනයේ නිරීක්ෂකයින්ට ඡන්ද මධ්‍යස්ථානය තුලට ඇතුලු වීමට ඉඩ නොදීමේ සිද්ධීන් වාර්තා වේ. මේ පිළිබඳව අදාල පැමිණිලි මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ ඇති ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථානයට CMEV ය විසින් ඉදිරිපත් කර ඇත.

අනිකුත් මැතිවරණ වලදි මෙන් මෙහිදිද මැතිවරණ දිනය ආසන්න වන විට ප්‍රචණ්ඩක්‍රියාවල වැඩිවීමක් දක්නට ලැබුණු අතර විශේෂයෙන් දකුණ සහ ඌව පළාත් මැතිවරණ වල යම් යම් සමානකම් ඇති බවට CMEV ආයතනය දක්වා සිටියි. මෙම පළාත් දෙකෙහි මැතිවරණයන් හිදි ඒ ආශ්‍රිත ප්‍රචණ්ඩක්‍රියාවන් හි ප්‍රමාණය අනිකුත් මැතිවරණයන්ට සාපේක්ෂව අඩු වූ අතර මැතිවරණ දිනයේදී පළාත් දෙකෙන්ම සමාන බරපතල සිද්ධීන් ප්‍රමාණයක් වාර්තා විය.

සබරගමුව සහ උතුරු මැද පළාත් සභා මැතිවරණයන් හිදි බරපතල සිදුවීම් 5 බැගින් වාර්තා වී ඇත. ඌව සහ දකුණු පළාත් සභා මැතිවරණයන් ගත්කළ බරපතල සිදුවීම් 8 බැගින් ඒ ඒ පළාත් වලින් වාර්තා වී ඇත.

සබරගමුව හා උතුරුමැද පළාත් හී පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියාවන්හි බරපතල සිදුවීම් පිළිවෙලින් 56 ක්, 70 ක් ලෙස වාර්තා වේ. ඌව සහ දකුණු පළාත් සභා මැතිවරණ පැවැත්වුයේ LTTE ය හමුදාමය වශයෙන් පරාජය කිරිමෙන් පසුව වන අතර එය පක්ෂ අතර මැතිවරණ සම්බන්ධ තරඟකාරීත්වය තීවුරතාවයට බලපාන සාධකයක් ද විය.

වගුව 1 - පළාත් සභා මැතිවරණ වල බරපතල ප්‍රචණ්ඩක්‍රියා

| මැතිවරණය | මැතිවරණ ප්‍රචාරක අවධිය තුළ CMEV ය විසින් තහවුරු කළ බරපතල සිද්ධීන් ගණන | මැතිවරණ දිනයේදී CMEV ය විසින් තහවුරු කළ බරපතළ සිද්ධීන් ගණන |
|---|---|---|
| නැගෙනහිර පළාත් සභාව | නිරීක්ෂණය නොකරන ලදි. | 72 |
| උතුරු මැද පළාත් සභාව | 61 | 05 |
| සබරගමුව පළාත් සභාව | 56 | 05 |
| වයඹ පළාත් සභාව | 70 | 20 |
| මධ්‍යම පළාත් සභාව | 46 | 30 |
| බස්නාහිර පළාත් සභාව | 62 | 13 |
| ඌව පළාත් සභාව | 32 | 08 |
| දකුණ පළාත් සභාව | 26 | 08 |

CMEV ආයතනය විසින් සඳහන් කළ එක් ප්‍රවණතාවයක් වුයේ එ.ජ.නි.ස අපෙක්ෂකයන් අතර සිදු වු ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්හි තත්ත්වයයි. දකුණු පළාත් මැතිවරණයේදී එ.ජ.නි.ස අපේක්ෂකයන් අතර වු ප්‍රචණ්ඩකාරී සිද්ධීන් 12ක් CMEV වෙත වාර්තා විය.

නැගෙනහිර පළාත හැර පළාත් සභා මැතිවරණ මාලාවේ පක්ෂ අතර අභ්‍යන්තරයෙහි ඇති වු ප්‍රචණ්ඩක්‍රියා වල එකතුව 31ක් විය. එය දකුණු පළාත් සභා මැතිවරණයේ දී වාර්තා වු සිද්ධීන් 12 මෙන් දෙගුණයකට වඩා වැඩි විය. මෙම තත්ත්වය ප්‍රචණ්ඩත්වයෙන් තොරව මනාප ජන්ද ලබා ගැනිම සඳහා තම පක්ෂයේ අපේක්ෂකයින් හැඩගස්වා ගැනීමට පක්ෂ නායකත්වයට ඇති වගකීම පිළිබඳව වු වැදගත්කම අවධාරණය කරන සාධකයක් බව CMEV පෙන්වා දේ. කෙසේ නමුත් ජන්ද භාවිතාවේ ප්‍රතිශතය ගත් කළ ඌව සහ දකුණු පළාත අතර සැලකිය යුතු වෙනස් කමක් ඇත. මෙවර පැවැති පළාත් සභා මැතිවරණ මාලාවේ වැඩිම ප්‍රතිශතයක් වාර්තා වුයේ ඌව පළාතෙන් වු අතර වයඹ පළාත හා බස්නාහිර පළාත හැර අනිකුත් පළාත් අතරින් අඩුම ප්‍රතිශතයක් වාර්තා වී ඇත්තේ දකුණු පළාතෙනි.

වගුව 2 - පළාත් සභා මැතිවරණ වලදි ජන්දය භාවිතා කිරීමේ ප්‍රතිශතය.

| **මැතිවරණය** | | **ජන්ද ප්‍රතිශතය** |
|---|---|---|
| නැගෙනහිර පළාත් සභාව | 2008 මැයි | 65.78% |
| උතුරු මැද පළාත් සභාව | 2008 අගෝස්තු | 67.75% |
| සබරගමුව පළාත් සභාව | 2008 අගෝස්තු | 68.37% |
| වයඹ පළාත් සභාව | 2008 පෙබරවාරි | 60.77% |
| මධ්‍යම පළාත් සභාව | 2008 පෙබරවාරි | 66.84% |
| බස්නාහිර පළාත් සභාව | 2009 අප්‍රේල් | 63.24% |
| ඌව පළාත් සභාව | 2009 අගෝස්තු | 70.03% |
| දකුණ පළාත් සභාව | 2009 ඔක්තෝබර් | 65.18% |

*(මැතිවරණ කාර්යාලය ඇසුරෙන්)*

**බරපතල සිද්ධීන් - මාතර දිස්ත්‍රික්කය**

මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර මැතිවරණ කොට්ඨාශයේ කෝට්ටෙගොඩ වාලුකාරාම මහා විද්‍යාලයෙහි පිහිටි අංක 33 දරණ ජන්ද මධ්‍යස්ථානයේ දි පෙරවරු 7.39 ට පමණ ජ.වි.පෙ මාධ්‍ය ඒකකයේ ප්‍රදීප් ශ්‍රීමාල් නැමැති අය වාර්තා කළේ, එස්. කේ. අජිත් නැමති ජ.වි.පෙ. ජන්දපොළ නියෝජිතයාට එකී ජන්ද මධ්‍යස්ථානයට ඇතුල් විමට ස්ථානාධිපතිවරයා විසින් ඉඩ නොදුන් බවයි. ජ.වි.පෙ විසින් තහවුරු කළ මේ සිද්ධිය CMEV ක්ෂේත්‍ර නිරීක්ෂකයා ද තහවුරු කරන ලදි.

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම මැතිවරණ කොට්ඨාශයේ පුවක්වත්ත දේවගිරි විද්‍යාලයේ අංක 41 දරණ ජන්ද මධ්‍යස්ථානයේ දි පෙ.ව. 8.10ට පමණ එහි සහකාර තේරීම්භාර නිලධාරිතුමාට CMEV ජංගම නිරීක්ෂණ කණ්ඩායම විසින් නිසි අවසර ලත් ලේඛන ඉදිරිපත් කළ ද ජන්ද මධ්‍යස්ථානය තුලට ඇතුලු විමට ඉඩ නොදුන් බවට එම කණ්ඩායම වාර්තා කරන ලදි.

මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය මැතිවරණ කොට්ඨාශයේ කොටපොළ කණිෂ්ඨ විද්‍යාලයෙහි පිහිටි අංක 21 දරණ ජන්ද මධ්‍යස්ථානයේදී පෙ.ව. 9.00 ට පමණ ජ්‍යෙෂ්ඨ ජන්ද පොළ නිළධාරි විසින් CMEV ක්ෂේත්‍ර නිරීක්ෂකට ජන්ද මධ්‍යස්ථානයට ඇතුළු විමට අවස්ථාව ලබා දුන් නමුත් අදාළ තේරීම්භාර නිලධාරීතුමා දක්වා ඇත්තේ ජන්ද මධ්‍යස්ථානය තුළ තොරතුරු ලබා ගැනිමට CMEV ආයතනයට නොහැකි බවයි.

මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස මැතිවරණ කොට්ඨාශයේ අංක 38 දරණ ජන්ද මධ්‍යස්ථානය අසල දී ප.ව 2.30 ට පමණ එ.ජා.ප ආධාරකරුවකු වු දයානන්ද බස්නායක වන අයට එ.ජ.නි.ස ආධාරකරුවන් වන රාජා හා ජනක යන අය පහර දුන් බව ජ.වි.පෙ. මාධ්‍ය සම්බන්ධීකාරක සජිත් ශ්‍රීමාල් මහතා දැනුම් දෙන ලදි. අදාල තුවාලකරු අකුරැස්ස දිසා රෝහල වෙත ඇතුල් කර තිබූ අතර එහි වෛද්‍ය සුමිත් හේවගේ මහතා CMEV ආයතනයට පවසා සිටියේ අදාල පහරදිමෙන් බස්නායක නැමැති අයට සුළු තුවාල සිදුවී ඇති බවයි. අකුරැස්ස පොලිසියේ පො.කො. සරත් (56062) මහතා CMEV ආයතනයට ප්‍රකාශ කර සිටියේ එම්.වයි. චන්ද්‍රිකා නැමති අය CIB2/19/46 අංකය යටතේ පැමිණිල්ලක් කර ඇති බවත් පෞද්ගලික ආරවුල්ලක් මත මෙය සිදු වි ඇති බවයි.

**බරපතල සිද්ධීන් - ගාල්ල දිස්ත්‍රික්කය**

ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර ඇල්පිටිය මැතිවරණ කොට්ඨාශයේ ගාල්ල වලගම්බාගල කණිෂ්ඨ විද්‍යාලයේ පිහිටි අංක 51 දරණ ජන්ද මධ්‍යස්ථානයේදී පෙ.ව 9.45 ට පමණ එ.ජ.නි.ස අපේක්ෂක ඩබ්ලිව්. ඩී. චමිල් පද්මලාල් (අපේක්ෂක අංක 24) ගේ ප්‍රචාරණ අත් පත්‍රිකා අදාල ප්‍රදේශයේ ග්‍රාම නිළධාරියා යැයි කියාගන්නා පුද්ගලයකු විසින් බෙදමින් සිටි බව CMEV ක්ෂේත්‍ර නිරීක්ෂක විසින් වාර්තා කරන ලදි. මෙකී සිදුවිම වලගම්බාගල කණිෂ්ඨ විද්‍යාලයේ ජන්ද මධ්‍යස්ථානය තුළ සිදුවුවත් එහි ජ්‍යෙෂ්ඨ ජන්දපොළ නිලධාරීතුමාගේ කිසිදු විරුද්ධත්වයක් එල්ල වි නොමැත. මේ අතර ඉහත කී ජන්ද අපෙක්ෂකයාගේ ප්‍රචාරණ පත්‍රිකා එම ජන්ද මධ්‍යස්ථානය අසල සිටි 60ත් 80 අතර කණ්ඩායමක් විසින් බෙදමින් සිට ඇති අතර තවත් කණ්ඩායමක් ජන්දය දැමීමට එන පුද්ගලයන්ගේ ලැයිස්තුවක් සකස් කරමින් සිට ඇති බවට වාර්තා වේ.

ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල මැතිවරණ කොට්ඨාශයේ ගලවඩුවාගොඩ පරමානන්ද විද්‍යාලය අසල පිහිටි අංක 8 දරණ ජන්ද මධ්‍යස්ථානය අසල පෙ.ව. 9.30 පමණ 5 දෙනකු පමණ කණ්ඩායමක් එ.ජ.නි.ස යේ රන්දිම ගමගේ මහතාට ජන්දය දෙන ලෙස ප්‍රකාශ කරමින් සිට ඇති බවට CMEV ක්ෂේත්‍ර නිරීක්ෂක වාර්තා කර සිටී.

ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර ඇල්පිටිය මැතිවරණ කොට්ඨාශයේ පිටුවාවල පුරාණ විහාරස්ථානයේ බණ ශාලාවේ පිහිටි අංක 48 දරණ ජන්ද මධ්‍යස්ථානයේදී පෙ.ව. 10.40 පමණ එ.ජ.නි.ස. යේ සජින් ද වාස්

ගුණවර්ධන මහතා වෙනුවෙන් ප්‍රචාරණ කටයුතුවල නිරත වු පුද්ගලයන් 7ක් පමණ කණ්ඩායමක් යෙදි සිටි බව CMEV ක්ෂේත්‍ර නිරීක්ෂක වාර්තා කර සිටි.

ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙණිය මැතිවරණ කොට්ඨාශයේ යටගල මහා විද්‍යාලයේ පිහිටි අංක 5 දරණ ඡන්ද මධ්‍යස්ථානයේදි පෙ.ව. 10.30 පමණ නුවන් මහේෂ් තිලකරත්න නැමැති අය පැමිණි විට ඔහුට ඇත්තේ තැපැල් ඡන්දයක් බව පවසා ජ්‍යේෂ්ඨ ඡන්දපොළ නිළධාරිතුමා විසින් ඡන්දය දැමිමට ඉඩ ලබා දී නොමැත. මෙහිදි තිලකරත්න මහතාගේ සහෝදරයා ශ්‍රී ලංකා හමුදාවේ සේවය කරන බවත් අදාල තැපැල් ඡන්දය ඔහුගේ සහෝදරයාගේ බව පැවැසු මුත් ඔහුට ඡන්දය දැම්මට ඉඩ දී නොමැත.

CMEV ආයතනයේ නිරීක්ෂණ කටයුතු සඳහා මැතිවරණ කොමසාරිස්වරයා සහ ඔහුගේ කාර්යමණ්ඩලයද, පොලිසියද දැක්වු සහයෝගයට CMEV ආයතනය සිය කෘතඥතාවය පලකර සිටියි.

අවසාන වශයෙන් මැතිවරණ ප්‍රචණ්ඩත්වය, මැතිවරණ නිති උල්ලංඝනය කිරීම සහ රාජ්‍ය සම්පත් අයථා ලෙස පරිහරණය කිරිම යන කාරණා මෙන්ම සමස්ථ මැතිවරණ ක්‍රියාවලියේම සුපිලිපන්නභාවය ආරක්‍ෂා කිරීමට නම් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාවට නැංවිමේ අවශ්‍යතාවය CMEV විසින් නැවතත් අවධාරණය කර සිටී.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථාන (CMEV) 1997 දි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.

නීතිඥ තුසිත සිරිවර්ධන
ජාතික සම්බන්ධිකාරක